# වෙළෙඳ අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# අධ්‍යක්ෂ ජනරාල් තනතුරට බඳවා ගැනීම

වෙළෙඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර (HM 2-2) සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

**(අ) බාහිර අයදුම්කරුවන් සඳහා**

(i) අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වාණිජ්‍ය / විද්‍යාව /කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය යන විෂයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක්

**සමඟ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව අවම වශයෙන් වසර 20 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් වසර 05 ක් සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය.

**හෝ**

(ii) අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වාණිජ්‍ය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය යන විෂයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ ඉහත ඕනෑම ක්ෂේත්‍රයකට අදාළව ආචාර්ය උපාධි සුදුසුකම (Ph.D)

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් අනතුරුව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්ද තිබිය යුතුය.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක (HM 2-1) අවම වශයෙන් වසර 02 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**සහ**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි බලතල, රාජකාරී සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම හා මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීමට සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳ පළපුරුද්දක් සහිත විය යුතුය.

**(ඇ) රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා:**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි බලතල, රාජකාරී සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පංතිය හා ඊට ඉහළ නිලධාරීන් ද්විතියන පදනම මත අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කිරීමට හැකි හෙයින් ඉල්ලුම් කළ හැක.

වැටුප් පරිමාණය (HM 2-2) : රු. 93,020/= 12 X 2,700 = රු. 125,420/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**වයස :**

වයස අවුරුදු 35 ට නොඅඩු සහ වයස අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්, රජයේ දෙපාර්තුමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් සුදුසුකම්**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

**තනතුර සඳහා හිමි වෙනත් ප්‍රතිලාභ :**

- 2016.10.27 දිනැති PED 1/2015 (i) චක්‍රලේඛය අනුව රාජකාරී කටයුතු සඳහා වාහනයක් අනුයුක්ත කරනු ඇත.
- අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
- ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා
- රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපද ණය
- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ආයතනයෙන් 3%

**අයදුම් කිරීමේ පිළිවෙල :**

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇත්නම්, අපනයන සංවර්ධන මණ්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබාගත් අයදුම්පතක් 2022.01.28 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය.

**ලේකම්, වෙළඳ අමාත්‍යාංශය,**
**එල්. එච්. පියසේන ගොඩනැගිල්ල,**
**492, ආර්. ඒ. ද මෙල් මාවත,**
**කොළඹ 03.**

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. රාජ්‍ය සේවයේ සහ අභ්‍යන්තර අයදුම්කරුවන් අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ලේකම්, වෙළඳ අමාත්‍යාංශය වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. තෝරා ගැනීම විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**ලේකම්, වෙළඳ අමාත්‍යාංශය,**
**492, ආර්. ඒ. ද මෙල් මාවත,**
**කොළඹ 03.**
**දුර : 011-2110570**
**දිනය : 2022.01.13**